**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සිංහල භාෂා අංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**

**8 ශ්‍රේණිය** **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන**

**කාලය පැය 02 යි.**

**i කොටසින් එක් ප්‍රශ්නයක් ද ii කොටසේ (අ) කොටසින් එකක් ද (ආ) කොටසින් එකක් ද (ඉ) කොටසින් එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

**i කොටස**

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) මිනිසාගේ පැවැත්ම උදෙසා දායක වන පරිසරය වර්තමානය වන විට සීඝ්‍ර ලෙස විනාශ වෙමින් පවතී.නව තාක්ෂණික දියුණුව හමුවේ නොමනා මිනිස් ක්‍රියාකාරකම් මෙයට හේතු වී ඇත. පරිසර විනාශය හේතුවෙන් අහිතකර ප්‍රතිඵල රැසකට මුහුණ දී ඇත. **“ පරිසර දූෂණය අවම කරමු ”** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ) පවතින තරඟකාරී සමාජ ක්‍රමය හමුවේ මිනිසා තුළ පවතින සාරධර්ම ක්‍රමයෙන් පිරිහී යමින් පවතී. වර්තමානය වන විට වැඩිහිටි නිවාස, ළමා නිවාස බහුලව පවතින අතර සමාජ විරෝධී ක්‍රියා බහුල වශයෙන් සිදුවේ. මෙම තත්ත්වය මඟ හරවා ගැනීමට මිනිස් සිත තුළ යහපත් ගුණ ධර්ම වර්ධනය කළ යුතුය. **“ සාරධර්මවලින් පිරි සමාජයක් ගොඩ නගමු”** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඇ) අතීතයේ ස්වයංපෝෂිතව පැවති ශ්‍රී ලංකාව වර්තමානය වන විට ප්‍රබල ආහාර හිඟයකට මුහුණ දී ඇත· කෘෂිකාර්මික කටයුතුවලින් බොහෝ පිරිසක් ඉවත් වී විවිධ රැකියා සඳහා යොමු වීම මෙයට බොහෝ විට බලපා ඇත.තමාට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය තම ගෙවත්ත තුළින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම ආහාර අර්බුදයට එක් විසඳුමකි. “සරු පොළවේ අපිත් වවමු” යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඈ) වර්තමානයේ නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය නොකිරීම නිසා බෝවන රෝග බහුල වශයෙන් පැතිර යමින් පවතී. එමගින් ගැටලු රැසකට මුහුණ දීමට සිදුව ඇත. යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම තුළින් මෙම තත්ත්වය අවම කළ හැකිය. “ නිරෝගී දිවියකට යහපත් පුරුදු” යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඉ) ඉතා දුෂ්කර ගමක ජීවත් වූ සමන් ඉගෙනීමට ඉතා දක්ෂ ශිෂ්‍යයෙකි. ඔහුගේ පියා ගොවිතැන් කටයුතු සිදු කළේය· 5 වන පන්තියේ ඉගෙනුම ලැබූ ඔහු පන්තියේ පළවෙනියා විය·පෙර පාසල් වියේ පසු වූ ඔහුගේ නැගණිය සහ මව සමඟ සතුටින් දිවි ගෙවූ සමන් ගමේ කාගේත් සිත දිනා ගත්තේය· ආර්ථික අපහසුතා මධ්‍යයේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ඔහු එයින් ඉහළින් ම සමත් විය.............................ඉහත සිදුවීම ඇසුරින් නිර්මාණාත්මක කතාවක් ගොඩ නගන්න·

(ලකුණු 40 යි)

**ii කොටස**

**(අ) (i)** ඔබ පාසලේ පැවති වාර්ෂික විවිධ ප්‍රසංගය පිළිබඳ තොරතුරු දන්වා දුර බැහැර ප්‍රදේශයක සිටින ඔබේ මිතුරෙකුට ලිපියක් ලියන්න·

**(ii)** ඔබ පාසලේ අලුතින් ඉදි කරන ලද පුස්තකාලයට අවශ්‍ය පොත් පරිත්‍යාග කරන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපියක් සකස් කරන්න·

**(ලකුණු 20)**

**(ආ) (i)** ඔබ පාසලේ ශිෂ්‍ය නායක තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසු අයදුම් පත්‍රයක් සකස්

(ii) ඔබ ප්‍රදේශයේ පැතිර යමින් පවතින ඩෙංගු රෝගය පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමක් පිළියෙල කරන්න.

**(ලකුණු 20)**

(ඉ) (i) වෙසක් සතිය නිමිත්තෙන් ඔබ පාසලේ සංවිධානය කළ භක්ති ගීත සංදර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස ආරාධනා කරමින් කොට්ඨාස අධ්‍යයක්ෂකතුමාට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න·

(ii) ඔබගේ හොඳම මිතුරාගේ උපන් දිනයට සුබ පතා සුබ පැතුම් පතක් සකස් කරන්න·

**(ලකුණු 20)**